# පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය හඳුනාගැනීම - ආරම්භයේ සිට ක්‍රිස්තු පූර්ව අවසාන තෙක් කෙරෙන විමර්ශනයකි

**චන්දන රෝහණ විතානාච්චි**


## Abstract

*Social archaeological researchers studying on Sri Lankan past, has to be concern the diversity of the population, administrative organization, social leaders, resource use, economic process, technological specializations, etc, existed in the studying socities. All these mentioned parameters and factors has a direct link with the development of ancient Sri Lankan irrigation systems as well. Origin and the development of irrigation is unbrokenly linked with the temptations of the commoners, as it catered to the many issues existed among them, i.e. agriculture, sanitation, husbandry, ritualistic, etc,. The present study is focusing to reveal the key factors influenced to the development of irrigation systems to end of 1st century BC. Some of the early irrigation works were directed by the elites in that society and some were by the royal monopoly that who gradually becomes the centre of power with the granted authority of controlling irrigation works. Who are the pioneers in the Early Historic Period of Sri Lanka engaged in such irrigation works? what are the remaining evidences to define their role and its extent? Why such people engaged on such matters? These key issues are considering here with a social archaeological approcah.*


**Key words:** Irrigation, Social Archaeology, Resources, Elites

**Author Details:** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

**Citation**: විතානාච්චි, චන්දන රෝහණ, (2013), පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය හඳුනාගැනීම - ආරම්භයේ සිට ක්‍රිස්තු පූර්ව අවසාන තෙක් කෙරෙන විමර්ශනයකි, The Journal of Archaeology and Heritage Studies, 1(2)

## ප්‍රවේශය

පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ වර්ධනය කෙරෙහි බලපෑ සමාජ පුරාවිද්‍යා අවකාශය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේදී එය පුළුල් ක්ෂේත්‍රයක් ඔස්සේ විමර්ශනය කළ යුතු බව පෙනේ. වාරි කර්මාන්තය යනු හුදෙකලාව බිහිවූවක් නොව ජනතාවගේ අවශ්‍යතා මත බිහිවී ඔවුන් නිසාම ක්‍රමයෙන් වර්ධනය වූ ක්‍රියාවලියක් ලෙස හඳුනාගැනීමට පුළුවන. ඒ අනුව පුරාතන සමාජය තුළ වාරි කර්මාන්තය බිහිවීමට මූලික වූ හේතු සාධකත් එය ක්‍රමයෙන් වර්ධනය වීම සඳහාත් වාරි කර්මාන්තයේ විවිධ අංශ ගොඩනැගීම සඳහාත් බලපෑ සමාජීය ක්‍රියාකාරීත්වය හඳුනාගැනීම වැදගත් වේ. අභිලේඛනමය මූලාශ්‍ර, ඓතිහාසික මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක දත්ත ද සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය ගොඩනැගීම කෙරෙහි උපයෝගී කරගැනීමේ හැකියාව පවතී.

ශ්‍රී ලංකාවේ පුරාතන අවධීන් සම්බන්ධයෙන් සමාජ පුරාවිද්‍යාත්මක අධ්‍යයන සිදුකිරීමේ දී ප්‍රධාන වශයෙන් එම අවධීන්හි පැවති ජන කණ්ඩායම් හි විවිධත්වය, පරිපාලන සංවිධාන, සමාජ නායකත්වය, සම්පත් පරිහරණය, ආර්ථික ක්‍රියාවලිය, විශේෂ ප්‍රාගුණ්‍යතාවයන් ආදී වශයෙන් හඳුනාගත හැකි නොයෙකුත් ක්ෂේත්‍රයන් ඔස්සේ ජන

සමාජයේ විහිදීම අධ්‍යයනය කිරීමට සිදු වේ. එයට ප්‍රධාන හේතුව වන්නේ ජන සමාජයක් යනු විවිධ පරාසයන්ගෙන් යුතු මානව ක්‍රියාවලීන්හි එකතුවක් ලෙස හඳුනාගත හැකි වන බැවිනි.

### පර්යේෂණ ගැටළුව

ආරම්භයේ සිට ක්‍රිස්තු පූර්ව අවසාන තෙක් පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තයේ වර්ධනය කෙරෙහි බලපෑ තීරක සාධක කුමක්දැයි සමාජ පුරාවිද්‍යා අවකාශය තුළ අනාවරණය කර ගැනීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව ලෙස හඳුනාගත හැකි ය.

### පර්යේෂණ ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයන සිදුකොට ඇති පූර්ව පර්යේෂකයින් එකී තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කොට ඇත්තේ අභිලේඛනමය මූලාශ්‍රයන් ය. සෙනරත් පරණවිතානයන් පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන ඇසුරින් එම සමාජයේ විවිධත්වය හඳුනාගැනීමට ගත් උත්සාහය මෙය නිදසුනකි (*Ic*. Vol.i). මීට අමතර ව සී. ඩබ්. නිකලස් ප්‍රධාන වශයෙන් ශිලා ලේඛන ද අමතර වශයෙන් වංශකතා මූලාශ්‍රයන් ද උපයෝගී කරගනිමින් පුරාතන සමාජ සම්බන්ධයෙන් විග්‍රහ කිරීමට උත්සාහ ගෙන ඇත (Nicholas: 1963). එයින් පැහැදිළි වන්නේ විද්වතුන් ගණනාවක් ම ශ්‍රී ලංකාවේ සමාජ ඉතිහාසය හඳුනාගැනීම පිණිස ශිලා ලේඛන මූලාශ්‍ර කෙරෙහි විශ්වාසයක් තබා කටයුතු කළ බවයි. වංසකතා මූලාශ්‍රයන්හි සඳහන් තොරතුරු බොහෝමයක් එය රචනා වූ කාලයේ පැවති දේශපාලන පසුබිම, ආගමික හේතු හා රචකයාගේ රුචිකත්වය මත යම් යම් වෙනස්කම්වලට ලක්වී තිබීමට ඉඩකඩ ඇති බැවින් එම තොරතුරු කෙරෙහි උදක්ම විශ්වාසය තබාගෙන කටයුතු කිරීම අපහසු වේ. ඇතැම් තොරතුරු ජනප්‍රවාදය ඇසුරින් කාලයක් පුරා පැමිණීමේ දී විවිධ විකෘතිවීම්වලට ලක්වීමට ඇති ඉඩකඩ ද නිසා වංසකතා මූලාශ්‍රවල තිබෙන තොරතුරු සම්බන්ධයෙන් ඇතැම්විට ගැටළු මතුකරයි. කෙසේ නමුත් ශිලා ලේඛනගත තොරතුරු සමකාලීන වන බැවින් ද අවශ්‍ය කාරණය කෙරෙහි මූලික අවධානයක් ලබාදී තිබෙන බැවින් ද එම තොරතුරු කෙරෙහි විශ්වාසය තබා කටයුතු කළ හැකි වේ. මෙය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන වල සිට අනුරාධපුරය අවසාන භාගය දක්වා වන ශිලා ලේඛන ඇසුරින් හඳුනාගැනීමට හැකියාව තිබේ. පොළොන්නරු යුගය වනවිට යම් යම් අතිශයෝක්තිගත තොරතුරු ඇතැම් ශිලා ලෙඛනවල දක්නට ලැබුන ද ඒවායේ දක්වන තොරතුරු වෙනත් සාධක ආදිය පදනම් කරගනිමින් තෝරාගැනීමේ හැකියාව පවතී. පුරාවිද්‍යාත්මක අර්ථයකින් මෙම වකවානුවේ සමාජය හදාරන විට නිතැතින්ම අප ඒ සඳහා පුරාකෘතිය සාධකයන් කොට ගනිමු. වෙසෙසින්, වාරිපද්ධති එහි ලා මහඟු දායකත්වයක් දක්වනුයේ මුත් සමාජ පුරාවිද්‍යාත්මක දෘෂ්ටියකින් යුක්තව අදාල දත්ත ඉදිරිපත් නොවීම හෝ පැහැදිලි නොවීමේ තත්ත්වයන් පවතී. සමාජ පුරාවිද්‍යාව තුලදී පුරාකෘතීන් කාලය හා අවකාශයේ අදාල ස්ථාන අනුව ගලපමින් ඒ තුලින් පද්ධති නිර්මාණය වූ ආකාරය සහ පද්ධති අතර සම්බන්ධතාවය පැවැති ආකාරය විග්‍රහ කිරිමට උත්සහ දරයි.

### න්‍යායාත්මක ප්‍රවේශය

පුරාවිද්‍යාව මගින් සමාජය විග්‍රහ කිරීමේ දී තනි තනි සිදුවීම් හා ඒවා අතර පවතින්නා වූ අන්තර් සම්බන්ධතාවයන් තේරුම් ගැනීමට උත්සහා කරනු ලබයි. එවැනි සිදුවීම් එලෙස ක්‍රියාත්මක වීමට බලපෑ හේතු කාරණා කවරේ ද යන්න සම්බන්ධයෙන් අනුමානයන්ට එළඹීම ද එමගින් අපේක්ෂා කළ හැකි ය. ඒ අනුව තනි ප්‍රපංචයක් ලෙසින් මෙන් ම ඒවා සමූහයක් වශයෙන් ඒකරාශී ව ගොඩනැගී තිබූ සමාජීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ය. එය පැහැදිළි කිරීමෙන් ඔබ්බට යා යුතු ක්‍රියාවලියකි. එනම් දැනුම ගොඩනැගීමේ දී, ගොඩනගා ගත් දැනුමේ වලංගු බව සහ විශ්වාසනීය බව තහවුරු කිරීමට එම දැනුම වාස්තවික (Objective) විය යුතු වේ. ඒ අනුව පුරාවිද්‍යා විෂයය ක්ෂේත්‍රය තුළ අපගේ අරමුණ විය යුත්තේ අප ක්‍රියාත්මක වන යථාර්තයේ පවතින්නා වූ සුවිශේෂී බව තේරුම ගැනීමයි. ඒ සඳහා විවිධ වූ න්‍යායාත්මක ප්‍රවේශයන් තුළ ප්‍රස්තුතයන් විග්‍රහ කිරීමේ හැකියාව පැවතිය හැකි ය. පුරාණ වාරි කර්මාන්තයේ සමාජ භාවිතය සම්බන්ධයෙන් සිදුකරනු ලබන පුරාවිද්‍යාත්මක විමර්ශනය තුළ න්‍යායාත්මක

ප්‍රවේශය තුළ මා විසින් උත්සහා ගනු ලබන්නේ වාරි කර්මාන්තයේ ප්‍රභවය කෙරෙහි බලපෑ සමාජ පසුබිම සම්බන්ධයෙන් සංකල්පීය ප්‍රවේශයක් ඉදිරිපත් කරලීමටත් ඒ තුළ වාරි කර්මාන්තයේ බිහිවීමට තුඩුදුන් හේතූන් සම්බන්ධයෙන් වන පුරාවිද්‍යාත්මක දෘෂ්ටිය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහයක යෙදීමටත් ය.

### විමර්ශනය

ලෝකයේ බොහෝ පැරණි සමාජ බිහිවී ඇත්තේ ගංගා නිම්න ශිෂ්ටාචාර (River basin civilization) වශයෙනි. මෙම ශිෂ්ටාචාරවල පවතින මූලික ලක්ෂණයක් වන්නේ ගඟ හේතුවෙන් පෝෂණය වන කිසියම් භූමි ප්‍රදේශයක් සීමාකොට ගනිමින් ජනාවාස බිහිකර ගැනීමයි. ගංගාව සමීපයේ වඩාත් සරුසාර භූමි ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් බිහිවූ **නයිල්, යුප්‍රටීස් ටයිග්‍රීස්, හොවැංහෝ, ඉන්දු** වැනි පුරාණ ගංගා නිම්න ශිෂ්ටාචාර මෙයට නිදසුන් වේ (Korovkin: 1985). එසේ වුව ද ලංකාවේ පුරාතන සමාජය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන කාරණයක් වන්නේ එය ගංගාව හෝ ඔය ලෙසින් හඳුන්වන ස්වභාවික ජල මාර්ගයේ කිසියම් සීමිත කොටසක් කේන්ද්‍ර කරගනිමින් බිහිවුණු ශිෂ්ටාචාරයක් නොවන බවයි. ඔවුහු ජල මාර්ගය සමීපයේ මෙන්ම නිම්නයෙන් වඩාත් දුරස්ථ ප්‍රදේශවල ද ජනාවාස බිහිකරගත් බවට මෙරට පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලා ලේඛනවල පැතිර යාම අනුව පැහැදිලි වේ ( *Ic*. Vol. i; *Ic*. Vol. ii). එහිදී නිම්නයෙන් දුරස්ථ භූමිය පෝෂණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු වැව හා අමුණ මුල් කරගත් වාරි ක්‍රම පදනම් කරගනිමින් සිදුකළ බව හඳුනාගත හැකි ය. එහිදී පුරාතන ශ්‍රී ලාංකීය සමාජය තුළ හඳුනාගත හැක්කේ වාරි මූලික වූ ශිෂ්ටාචාරයක් (Irrigation based civilization) බව පැහැදිලි ය. ප්‍රධාන ශිෂ්ටාචාර මෙන් රේඛීය තනි ගංගා පද්ධතියකට සීමා වී වර්ධනය ශ්‍රී ලංකාවේ පුරාණ ශිෂ්ටාචාරය රට පුරා විහිදී පැවැති ගංගා සහ ඔය ලෙස හඳුන්වන ජල මූලාශ්‍රය හා ඒවායේ පෝෂක අසුරු කර ගනිමින් බිහි වී වර්ධනය විය. ශිෂ්ටාචාරය මූලික වශයෙන් අනුරාධපුර වැනි ස්ථානයක කේන්ද්‍රගතව පසුව ප්‍රත්‍යයන්තයට ව්‍යාප්ත වුයේද නො එසේ නම් ප්‍රත්‍යයන්තයේ ක්‍රමයෙන් දියුණු කෘෂි වාරි අර්ථ ක්‍රමයේ ඵලයක් ලෙස මධ්‍ය කේන්ද්‍රීය පාලන මධ්‍යස්ථානයක බිහි වූ වුයේද යන්න මෙහිදී විමසා බැලිය යුතුය. මෙසේ පළමුවැන්න පාලක පන්ති පාදක වාරි වර්ධනයේ නියෝජනය කිරීමටද දෙවැන්න සාමාන්‍ය සමාජයේ අවශ්‍යතා මත වාරි කටයුතු බිහිවීමේ පසුබිමත් ලෙස ද ක්‍රියාකාරී විය හැකිය. මෙම වාරි මූලික ශිෂ්ටාචාරය තුළ දැකිය හැකි විශේෂත්වය වන්නේ ප්‍රධාන හෝ උප නිම්න වල පිහිටි ස්වභාවික ජල මාර්ගවල ජලය, වාරි ක්‍රමෝපායන් භාවිතයෙන් ප්‍රයෝජනයට ගැනීමය. මීට අමතර ව වැස ජල කළමනාකරණයක් ද වාරි මූලික ශිෂ්ටාචාරය තුළ හඳුනාගත හැකි ය. ලංකාවේ වියළි කලාපය හා අන්තර් කලාපය ආශ්‍රිත ව දක්නට ලැබෙන කුඩා වැව් විශාල ප්‍රමාණයක් වැසි ජලය මත පෝෂණය වන වැව් ලෙසින් හඳුනාගත හැකි බැවින් පැහැදිළි වන කාරණයක් වනුයේ වැසි ජලය නෙලාගනිමින් එක්රැස් කොට ගබඩා කරගෙන කෘෂි කාර්මික හා අනෙකුත් සාමාජීය අවශ්‍යතා සඳහා විධිමත් ආකාරයෙන් ප්‍රයෝජනයට ගත් බවයි. ඒ අනුව ලෝකයේ වැසි ජල කළමනාකරණය සම්බන්ධයෙන් වන පැරණි ම නිදසුනක් හමුවන්නේ ශ්‍රී ලංකාවේ වියළි කලාපීය වාරි මූලික ශිෂ්ටාචාරයෙන් බව පැහැදිළි ය.

### වාරි කර්මාන්තයට ප්‍රවේශවීම

වාරි කර්මාන්තයේ ප්‍රගමනයට බලපෑ සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය හඳුනාගැනීමේ දී පූර්ව ඓතිහාසික අවධියේ (Proto Historic Period) මෙරට ජනාවාසකරණය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට සිදුවේ. ශ්‍රී ලංකාවේ වඩාත් සංවිධානාත්මක පැරණිම ජනාවාස හමුවන පූර්ව ඓතිහාසික අවධිය වන විට ජනතාව තම අවශ්‍යතාවන් ඉටුකරගත හැකි ප්‍රදේශ කෙරෙහි යොමුවන බව පැහැදිලි ය. දඩයම හා ආහාර රැස්කිරීම පමණක් තම ජීවනෝපායේ මූලිකාංග සේ නොසලකා සත්ව පාලනය හා සීමිත කෘෂි කර්මාන්තය මත පදනම් වූ යැපුම් ආර්ථික රටාවක් ආරම්භවීම පූර්ව ඓතිහාසික අවධියේ දක්නට ලැබෙන ප්‍රධානතම ලක්ෂණය වේ. එතෙක් පැවති ඒකාකාරී යැපුම් ක්‍රමය වෙනුවට පරිසරය මත පදනම් වූ විවිධත්වයෙන් යුතු අර්ථ ක්‍රමයකට යොමුවීම මෙම අවධියේ දී සිදුවී ඇත. ඒ අනුව මෙරට පූර්ව ඓතිහාසික ජනතාව ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට යෝග්‍ය වූත්

අවශ්‍යතාවයන් පහසුවෙන් සපුරාගත හැකි වූත් ප්‍රදේශවල ස්ථාවර ජනාවාස බිහිකර ගැනීම කෙරෙහි යොමුවී ඇති බව පෙනේ. මෙම අවධියේ ජනාවාස හඳුනාගත හැකි විශේෂ ලක්‍ෂණ ලෙස **මහා ශිලා සුසාන භූමි** (Megalitic Burials) හා **කාල රක්ත මෙවලම්** (Black and Red wear) අවශේෂ දැක්විය හැකි ය. මෙම ලක්‍ෂණ පදනම් කරගනිමින් පූර්ව ඓතිහාසික අවධියේ සංස්කෘතිය, **මෙගලිතික කාල රක්ත මෙවලම් සංස්කෘතිය** (Megalitic black and Red wear culture) ලෙස හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික මුල් යකඩ යුග සංස්කෘතිය ආසන්න වශයෙන් ක්‍රිස්තු පූර්ව 1000 - ක්‍රිස්තු පූර්ව 300 අතර කාලය තුළ ක්‍රියාත්මක වී ඇත (Deraniyagala 1992 b: 717-8, 723, 740-2; Paranavitana 1956: 14; Begly 1981: 49-95; Indrapala 1969: 51). (Senavirathne 1996: 279). මහාවංසය ප්‍රධාන මූලාශ්‍රවල සඳහන් තොරතුරු අනුව පැහැදිළි වන්නේ ක්‍රිස්තු පූර්ව 6 වන සියවස වන විට ලංකාවේ යක්‍ෂ, නාග, දේව යන කණ්ඩායම් තුනක් සිටි බවත්, ඔවුන් සංවිධානාත්මක සමාජ රටාවක් තුළ කටයුතු කළ පිරිසක් වන බවත් ය (*මව.* i,vii). මෙම ජන සමාජයේ යකඩ භාවිතය පිළිබඳ දැණුම, අශ්වයින් පරිහරණය, කාල රක්ත මැටි බඳුන් භාවිතය, වී වගාව හා සත්ව ගෘහස්ථකරණය පැවැති බවට සාධක පවතී (Deraniyagala 1992b: 740). ක්‍රිස්තු පූර්ව 600 - 500 අතර කාලය වන විට ඔවුන් සාක්‍ෂරතාවය පිළිබඳ ව දැණුම ලබා තිබූ බව දැරණියගල පවසයි. (*එම.* 740-2). ඒ අනුව වංසකතාවේ සඳහන් තොරතුරු සමඟ මෙම පුරාවිද්‍යාත්මක සාක්‍ෂි සසඳන විට පැහැදිළි වන්නේ යක්‍ෂ, නාග, දේව ගෝත්‍ර මෙරට පූර්ව ඓතිහාසික අවධිය නියෝජනය කළ ස්වදේශික ජනතාව විය හැකි බවයි.

ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික ජනාවාස ප්‍රධාන වශයෙන් වියළි කලාපීය ගංගා නිම්නාශ්‍රිත ව ස්ථානගත වී තිබේ (Senavirathne 1984: 240-262). ඒ බව සුසාන භූමිවල ව්‍යාප්තිය අනුව පැහැදිළි වේ. ගොවිතැනට යෝග්‍ය වියළි දේශගුණයක් හා පසකින් යුතු මෙම ප්‍රදේශයේ තිබෙන දීර්ඝ කාලීන වියළි කාලගුණය මත කෘත්‍රිම ජල සම්පාදනයෙන් ඵලදායි ලෙස කෘෂි කාර්මික කටයුතුවල නිරතවීමට හැකිවීම මෙම කලාපයේ ජනාවාස ව්‍යාප්තවීමට බලපෑ ප්‍රධාන හේතුව ලෙස සැළකිය හැකි ය. ඒ අනුව පූර්ව ඓතිහාසික අවධියේ දී මෙම කළාපයේ ජීවත් වූ ජනතාව මෙරට වාරි කර්මාන්තයේ ආරම්භකයින් බව පෙනේ. අධ්‍යයන ප්‍රදේශයට අයත් පුරාණ වාරි නිර්මාණ පිළිබඳ සාක්‍ෂි සහිත ගංගා නිම්නාශ්‍රිත ව තිබෙන මෙගලිතික ජනාවාස සමහරක් පිළිබඳ ව මෙලෙස දැක්වීමට පුළුවන.

I. **යාන් ඔය නිම්නය** - ගුරුගල්හින්න, තම්මැන්නාගොඩැල්ල, වඩිගවැව, රඹෑව, කොක්ඇබේ, දිවුල්වැව, සියඹලාවැව, සීගිරිය ඇතුළු තව බොහෝ

II. **මල්වතු ඔය නිම්නය** - අනුරාධපුර, තෙක්කම්, අලුත්බෝමුව, සියඹලාගස්වැව, ඊරුවැව, සන්දනම්කුලම, මන්තායි, නෙළුබෑව ඇතුළු තව බොහෝ

III. **කලා ඔය නිම්නය** - කරම්බන්කුලම, රාජාංගනය, පොම්පරිප්පු, ඉබ්බන්කට්ටුව, ආනකටාව, යටිගල්පොත්ත, කන්දලම ඇතුළු තව බොහෝ

IV. **දැදුරු ඔය නිම්නය** - පින්වැව, පොල්පිතිගම

මූලික අදහසට අනුව මුල් ඓතිහාසික අවධියේ වියළි කලාපයට වැව් හඳුන්වා දෙනු ලබන්නේ කෘෂි කර්මාන්තයට අවශ්‍ය පරිදි ජල සම්පාදනය කිරීමේ අපහසුතාවයට විසඳුමක් වශයෙනි. ගංගා නිම්නවල ජනාවාස පිහිටුවාගත් මූල ඓතිහාසික අවධියේ ජනතාව අතර ආදිතමයින් තාවකාලික වැටි වේලි ආදිය යොදාගනිමින් ජල මාර්ග හරස්කර කෘෂි බිම් සඳහා ජලය ලබාගන්නට ඇති බවත් ක්‍රමයෙන් ජනගහනය අධිකවීම තුළ එම ජල සම්පාදන ක්‍රම ප්‍රමාණවත් නොවූ හෙයින් තැනිතලා භූමියේ තිබෙන තිරශ්චීන වැටි හා උස් බිම් උපයෝගී කර ගනිමින් කුඩා වැව් තනාගෙන අහස් දිය රැස්කරගෙන කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගන්නට ඇත.

මුල් ඓතිහාසික අවධිය වන විට විස්තෘත ජනාවාස රටාවක් පැවැති බව නියෝජනය කරන සුසාන භූමිවල විසිරුම් රටාව අනුව තීරණය කිරීමට පුළුවන. මෙයින් පැහැදිළි වන්නේ මෙකී ජනාවාස ක්‍ෂුද්‍ර ජනාවාස ලෙසින් පවතින්නට ඇත යන්නය. මෙකී ක්‍ෂුද්‍ර ග්‍රාමීය ජනාවාස ස්ථානගත වීමේදී භූමියේ ස්වභාවය කෙරෙහි සැළකිලිමත් වන්නට ඇති බව සිතිය හැකි වේ.

මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ස්ථානයට සම්බන්ධ සම්බන්ධව සැලකිල්ලට ගැනීම පෙනී යුනයේ බොහෝ විට ඒවා "බහු ලාක්ෂණික උපයෝගීතාවය(Multi Attribute Utility) පිළිබඳව සැලකිලිමත් වී ඇති බවකි. සම්ප්‍රදායික ගම පිළිබඳව ස්ථායික ආකෘතියෙන් ද (Tennakoon in Bandaranayaka et al, 1990) පැහැදිලි කරන මෙයට අනුව ජල, කෘෂි, සුීථ යැපුම්, ආරක්ෂක, ප්‍රවේශ, දේශගුණික, සාධක මෙම මුල් ජනාවාස සැලකිල්ලට ගත් බවත් සැලකිය හැකිය. මහරක්ධ රක්ධ යන පුද්ගල එහිදි වැඩි වශයෙන් කෘෂි කර්මාන්තය සඳහා යෝග්‍ය පාංශු රටාවන් තිබීම කෙරෙහිත්, කෘෂි කර්මාන්තය හා අනෙකුත් අවශ්‍යතාවන් සඳහා ජල සම්පාදන ක්‍රමවේදයන් සකසා ගැනීමේ ඇති හැකියාවන් පිළිබඳවත් අවධානය යොමුකරන්නට ඇත. පූර්ව ඓතිහාසික මුල් යකඩ යුගයේදී ජනතාව සිදුකොට ඇත්තේ භූ පිහිටීම උපයෝගී කරගනිමින් ස්වභාවික පතස් හා පහත් භූමි ආවරණය වන පරිදි වඩා උස් නොවූ වේලි බැඳ කුඩා ප්‍රමාණයේ වැව් සකස් කර ගැනීමයි. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ පිහිටි සුසාන සහිත ස්ථාන රැසකින් හඳුනාගත හැකි කුඩා ප්‍රමාණයේ වැව් පිළිබඳ සාක්ෂි මෙයට නිදසුනකි. ඉබ්බන්කටුව ආශ්‍රිත ඉදමොරළු වැව, යාපහුව කොණ්ඩදෙනිය සුසාන භූමිය අවට පිහිටි කුඩා වැව්, ගුරුගල්හින්න, සන්දනම්කුලම, සියඹලාගස්වැව වැනි සුසාන භූමි ආශ්‍රයෙන් හඳුනාගත හැකි වැව්, පොම්පරිප්පු සුසාන භූමිය ආසන්නයේ දක්නට ලැබෙන වැව්, කොක් ඇබේ සුසාන භූමියට සමීපයෙන් දක්නට ලැබෙන වැව් හා ඇළ මාර්ග, තම්මැන්නාගොඩැල්ල සුසාන භූමියට සමීපයෙන් පිහිටි කුඩා වැව, වඩිග වැව සුසාන භූමියට ආසන්නයේ පිහිටි වැව මෙයට නිදසුනකි. පොම්පරිප්පු මෙගලිතික සුසාන භූමිය හා ඒ අසල වූ වැව අතර පැවති සම්බන්ධතාව පරීක්ෂා කිරීමට ද එක් අවස්ථාවක උත්සාහ ගෙන තිබේ (Begley 1981: 59). වංසකථා මූලාශ්‍රවල දැක්වෙන තොරතුරු අනුව ද එකල මෙරට ජලය රැස් කිරීමේ ක්‍රමවේද පැවති බව තහවුරු වේ. විජය කුමරු හා කුවේණිය පිළිබඳ දැක්වෙන කථා පුවතේ සඳහන් පොකුණු (*මව.* vii: 12), පණ්ඩුකාභය පුවතේ සඳහන් තිඹිරි යහන විල (*එම.* x: 53) මෙයට නිදසුන් ලෙස දැක්විය හැකි ය. මීට අමතර ව ජල මාර්ග හරස්කරමින් ප්‍රාථමික ගල්වැටි තනමින් ජලය හරවා ලබා ගැනීමේ ක්‍රමවේදයන් ද අනුගමනය කරන්නට ඇත. අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත කලා ඔය හා යාන් ඔය ආශ්‍රිත සමහරක් අමුණුවලින් හඳුනාගත හැකි ඇතැම් ශිලා ඛණ්ඩවල පිහිටීමේ ස්වභාවය හා විභේදන රටාවන් නිරීක්ෂණය කිරීමේ දී පෙනීයන කාරණයක් වනුයේ ඒවා අමුණක ප්‍රාථමික ඉදිකිරීම් අවධිය නියෝජනය කරන බවයි.

පූර්ව ඓතිහාසික අවධියේ මෙවැනි කුඩා ප්‍රමාණයේ වාරි මාර්ග ක්‍රම ආරම්භ වීම කෙරෙහි ඒ වන විට එම ජනතාව සතුව පැවති මුල් යකඩ යුගයේ තාක්ෂණය පිළිබඳ දැණුම හා ලෝහ මෙවලම් උපයෝගී කරගන්නට ඇත. මෙකල සුසාන නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන ශිලා විභේදනය පිණිස මෙන්ම කෘෂි කාර්මික හා අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය උපකරණ නිපදවාගැනීම පිණිස වානේ භාවිතය සාර්ථකව සිදුකරන්නට ඇති බව පෙනේ. ඒ අනුව වැව් ඉදිකිරීම සඳහා ද ලෝහ උපකරණ භාවිතය ඉවහල් වන්නට ඇති බව සිතිය හැකි වේ.

## මුල් ඓතිහාසික අවධියේ වාරි නිර්මාණයේ සමාජ පුරාවිද්‍යාත්මක අවකාශය

පූර්ව ඓතිහාසික අවධියේ අවසානය මුල් ඓතිහාසික අවධියේ (Early historic) ආරම්භය ලෙස සලකනු ලැබේ. එය පූර්ව ඓතිහාසික සංස්කෘතියේම තවත් වර්ධනීය අවස්ථාවක් බව සෙනෙවිරත්න පෙන්වා දී ඇත (Seneviratne 1996: 279). එය පොදුවේ ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක සමාජයේ ආරම්භක අවධිය ලෙස සලකනු ලබයි. ක්‍රිස්තු පූර්ව 300 - ක්‍රිස්තු පූර්ව 100 ත් අතර කාලයට මුල් ඓතිහාසික අවධිය අයත් වන බව පිළිගනු ලැබේ (*එම*). මුල් ඓතිහාසික අවධිය සම්බන්ධයෙන් තොරතුරු හඳුනාගත හැකි පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන ඇසුරින් එකළ සමාජයේ ජන ප්‍රසාරණය සම්බන්ධයෙන් තොරතුරු රැසක් අනාවරණය කරගැනීමේ හැකියාව පවතී. එමගින් එවකට පැවති සමාජ සැකැස්ම හා ඔවුන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් හෙළිවන තොරතුරු ප්‍රමාණය අතිමහත් ය. විශේෂත්වයක් වන්නේ මෙම ශිලාලේඛන ඇසුරින් මෙරට ඓතිහාසික මූලාශ්‍ර වලින් හෙළි නොවන ජන කණ්ඩායම් පිළිබඳ වත්, ඔවුනගේ තනතුරු නාම සහ කාර්යභාරයන් පිළිබඳවත් කරුණු අනාවරණය කරගත හැකි වීමයි.

වගුව 1. **Inscription of Ceylon Vol. i** හි සඳහන් පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි 1105 අතරින් අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටි සෙල්ලිපි ප්‍රමාණය හා ප්‍රතිශතය

| දිස්ත්‍රික්කය | පූර්ව බ්‍රාහ්මී සල්ලිපි ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| අනුරාධපුර | 269 | 40% |
| කුරුණෑගල | 169 | 25% |
| පොළොන්නරුව | 51 | 7.6% |
| මාතලේ | 60 | 8.9% |
| අනෙකුත් තදාශ්‍රිත ප්‍රදේශය | 122 | 18% |

වගුව 2. **Inscription of Ceylon Vol. i** හි සඳහන් පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි 1105 අතරින් අධ්‍යයනක්ෂේත්‍රයට අදාල ප්‍රධාන ගංගා නිම්නයන්හි පිහිටි සෙල්ලිපි ප්‍රමාණය හා ප්‍රතිශතය

| ගංගා නිම්නය | පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| දැදුරු ඔය | 103 | 9.3% |
| කලා ඔය | 123 | 11.2% |
| මල්වතු ඔය | 162 | 14.6% |
| යාන් ඔය | 85 | 7.7% |

අධ්‍යයනය ප්‍රදේශය තුළ මෙම පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවල වැඩි ව්‍යාප්තියක් පෙන්නුම් කරන බව හඳුනාගත හැකි ය. ලංකා ශිලා ලේඛන සංග්‍රහයේ (Inscription of Ceylon) පළමු කාණ්ඩය සංස්කරණය කරන අවධිය වන විට මෙරට පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන 1105 ක් හඳුනාගෙන තිබී ඇත (*Ic*. Vol: 1-100). ඒ අතරින් අධ්‍යයනය ප්‍රදේශය සහ තදාශ්‍රිත භූමියේ දළ වශයෙන් එවැනි සෙල්ලිපි 671 කට වැඩි ප්‍රමාණයක් තිබේ. එය ප්‍රතිශතයක් ලෙස 60.7% ක පමණ ප්‍රමාණයකි.

එම සෙල්ලිපි ව්‍යාප්තිය ආසන්න ලෙස දැදුරු ඔය නිම්නයේ 103, කලා ඔය නිම්නයේ 123, මල්වතු ඔය නිම්නයේ 162, සහ යාන් ඔය නිම්නයේ 85 ක පමණ ප්‍රමාණයක් පවතින බව හඳුනාගැනීමට පුළුවන. එයින් පැහැදිළි වන්නේ පූර්ව ඓතිහාසික අවධිය මෙන්ම මුල් ඓතිහාසික අවධිය වන විට ද මෙරට ජනතාවගේ වඩාත් ආකර්ශනීය ප්‍රදේශය ලෙස පැවතී ඇත්තේ අධ්‍යයන ප්‍රදේශයට අයත් වන මෙරට වියළි කලාපීය භූමිය වන බවයි.

මෙම සෙල්ලිපිවල ව්‍යාප්තිය අනුව පැහැදිළි වන්නේ මුල් ඓතිහාසික සමය වන විට අධ්‍යයන කලාපය නියෝජනය කරන වයඹ, උතුරුමැද හා තදාශ්‍රිත කලාපය තුළ ජන ප්‍රසාරණය වඩාත් විධිමත්ව සිදු වී තිබෙන බවකි. සමාජ ස්ථරගත වීම හා ශ්‍රේණිගත වීම ක්‍රමිකව සිදු වී තිබෙන බව එම සෙල්ලිපි ආශ්‍රයෙන් හඳුනාගත හැකි පදවි නාමයන්ගෙන් පැහැදිළි වේ. ක්ලෑසන් (Clereassen) පෙන්වා දෙන්නේ ජන කොට්ඨාස අතර ඇතිවන්නා වූ ස්ථරගත වීම ආර්ථික හා සමාජීය කරුණු මත සිදුවන

වගුව 3. **Inscription of Ceylon Vol. i** හි සඳහන් පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි අතරින් අධ්‍යයන ප්‍රදේශයේ පිහිටි විවිධ නිළතල සඳහන් සෙල්ලිපි ප්‍රමාණය හා ප්‍රතිශතය

| පදවි නාමය | පූර්ව බ්‍රාහ්මී ලිපි ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| මහරඣ | 28 | 4.1% |
| රඣ | 12 | 1.7% |
| පරුමක | 243 | 36.2% |
| ගමණි | 7 | 1% |
| ගමික | 52 | 7.7% |
| ගපති | 48 | 7.1% |
| බරත | 21 | 3.1% |
| බත | 85 | 12.6% |
| අය | 5 | 0.7% |
| අශ | 12 | 1.7% |
| උපශක | 63 | 9.3% |

ක්‍රියාවලියක් බවත් එමගින් පාලන සංවිධානයක් ගොඩනැගීමේ සාධක බිහිවන බවත් ය (Claessen and Skalnik 1978: 545-6). එම අදහස මුල් ඓතිහාසික අවධියේ ශ්‍රී ලංකාවේ සමාජ සැකැස්ම පිළිබඳ පරීක්ෂා කිරීමේ දී තවදුරටත් තහවුරු වනබව පෙනේ. ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධිය තුළ සමාජ ස්ථරගත වීම පැහැදිළිව හඳුනාගත හැකි බව මෙන්ඩිස් ප්‍රකාශ කර තිබේ (මෙන්ඩිස් 2010). මෙම ස්ථරගත වීම අධ්‍යයන කලාපය තුළ පිහිටි පූර්ව බ්‍රාහ්මී අභිලේඛන ඇසුරින් මහරජ, රජ, පරුමක, ගමණි, ගමික, ගපති, බරත, බත, අය, අශ, උපසක ආදී වශයෙන් සිදුවී තිබෙන බව ඉහත සඳහන් වගුව (වගුව 3) ඇසුරින් හඳුනාගත හැකිය.

මුල් ඓතිහාසික ශිලා ලේඛන මගින් එකළ ජන ප්‍රසාරණය සිදුවී තිබෙන ආකාරය සම්බන්ධයෙන් පැහැදිළි අදහසක් ලබාගත හැකි ය. ඒ අනුව ක්‍රිස්තු පූර්ව 3-1 සියවස් අතර කාලය වන විට අධ්‍යයන ක්ෂේත්‍රය තුළ පිහිටි ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශයේ ජනාවාස බිහිවීම ඉහළ මට්ටමක පැවති බව අනාවරණය කරගත හැකි ය. මෙම සෙල්ලිපි ඇසුරින් මෙම ක්‍රියාවලිය සඳහා නායකත්වය දුන් පිරිස් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කරගැනීමට පුළුවන. පරුමක, ගපති, ගමික, බත ආදී වශයෙන් සඳහන් වන මෙම පදවි නාමයන් ඇතැම් විට ගෝත්‍රික පදනමක් හෝ ව්‍යාප්තියක් මත සකස් වූ ජනාවාස ක්‍රියාවලියකට නායකත්වය දුන් පිරිසකගේ විය හැකි ය. ආර්.ඒ.එල්.එච්. ගුණවර්ධන ප්‍රකාශ කරනුයේ ගමණි, ගපති, පරුමක වැනි පදවි නාමයන් මගින් සමාජය තුළ පැවති ශ්‍රේණිගත වීමක් පෙන්නුම් කරන බවත්, එමගින් තත්කාලීන සමාජ දේශපාලන තත්ත්වය සම්බන්ධයෙන් අවබෝධයක් ලැබිය හැකි බවත් ය (Gunawardene 1981: 70-88).

මහරඣ හෝ රඣ යන තොරතුරු වලට වඩා දෙවන පෙළ නායකත්වය පිහිටි පරුමක, ගපති, ගමික, බත යන පුද්ගල ක්‍රියාකාරීත්වය මුල් ඓතිහාසික අවධියේදී සමාජ ප්‍රගමනයට වැඩි අවශ්‍යතාවයකින් යුත් බව මෙම

වගුවෙන් පැහැදිලි වේ. මෙම නායකත්වය සරලවම ජනාවාසයක පොදු පුද්ගල සම්මුතික් හෝ විශේෂිත නායකත්ව ලක්ෂණ/පදනම මත ඉස්මතු වීමත් ඔවුන් පොදු සමාජ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීමත් වු බව උපකල්පනය කල හැකිය. පරුමක පදවි නාමය දරණ ජන කණ්ඩායම මෙකල සමාජ ස්ථරකරණය තුළ මූලිකත්වය ගෙන කටයුතු කළ බව පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි ඇසුරින් තහවුරු වේ. ඉපැරණි සුසාන භූමි ආශ්‍රිත ව පරුමකවරු සම්බන්ධ ශිලා ලේඛනවල වැඩි ව්‍යාප්තියක් පෙන්නුම්කරන බව සෙනවිරත්න ප්‍රකාශ කර තිබේ (Senevirathne 1989 : 114). ඒ අනුව පරුමකවරුන්ගේ ප්‍රභවය පූර්ව ඓතිහාසික අවධියේ සිටම සිදුවූ බව නිගමනය කිරීමට පුළුවන. ශ්‍රී ලංකාවේ මෙගලිතික සුසාන හා ජනාවාස භූමි ආශ්‍රිත ව දක්නට ලැබෙන පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපිවල වැඩි වශයෙන් සඳහන් වන පරුමකවරු (*Ic.* Vol: No. 106, 107, 119, 120, 125, 127, 130, 131, 133a, 148, 152, 153, 159, 161, 162, 163, 166, 169,170,174, 180, 182, 183, 196, 203, 838, 847, 848, 854, 856, 1043, 1044) එම ප්‍රදේශවල වාසය කළ පූර්ව ඓතිහාසික ස්වදේශික ගෝත්‍රික ජනතාවන්ගෙන් පැවතෙන බව සිතිය හැකි ය. සුසාන භූමි අවට විස්තෘත කලාපයක් තුළ මෙවැනි සෙල්ලිපි හමුවීමෙන් පැහැදිළි වන්නේ පූර්ව ඓතිහාසික ජනාවාස මුල් ඓතිහාසික අවධිය වන විට ක්‍රමයෙන් ප්‍රසාරණයට ලක්වෙමින් පැවති බවයි. ඒ සඳහා නායකත්වය ගන්නට ඇත්තේ පරුමකවරුන් විසින් විය හැකි ය. ඔවුන් සම්බන්ධ ශිලා ලේඛනවල වැඩි ඝනත්වයක් හඳුනාගත හැකිවීමෙන් ඒ බව පැහැදිළි වේ. මෙම නිල නාමය පූර්ව ඓතිහාසික අවධියේ සිට මෙරට ජනප්‍රියව පවතින්නට ඇති බව නිගමනය කළ හැක්කේ ක්‍රිස්තු පූර්ව 2 - 1 සියවස් වන විට මෙරට වඩාත්ම බහුලව භාවිත වූ නිල නාමය වීම නිසාය. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 36.2% ප්‍රමාණයක ඉහළ අගයක් ගන්නා බව හඳුනාගත හැකි ය. ඒ අනුව පැහැදිළි වන්නේ පරුමකවරු තත්කාලීන සමාජයේ පුළුල් ජන ප්‍රසාරණයක් සහිතව සිටි ජන කණ්ඩායම නියෝජනය කරන බවයි. මොවුන් පිළිබඳ අදහසක් ඉදිරිපත් කරන එස්. කේ. සිත්‍රම්පලම් පවසන්නේ පරුමකවරු එකළ සමාජයේ මූලිකත්වය ගෙන කටයුතු කළ පිරිසක් වන බවයි (Sitrampalam 1986/87: 13).

පරුමකවරු සමකාලීන සමාජය තුළ එක් විශේෂිත කාර්යයක් සඳහා සීමා වූ පිරිසක් නොවන බව සෙල්ලිපි ඇසුරින් හඳුනාගත හැකි ය. ඒ අනුව පරුමකවරු ක්‍රියාත්මක වී ඇත්තේ සමාජමය අවශ්‍යතාවන් අනුව බව පෙනේ. එය සමාජ, ආර්ථික, දේශපාලනික හා ආගමික යන සියළු ක්ෂේත්‍රයන් සමගම බද්ධ වී තිබුණ බව පැහැදිළි කරගත හැකි ය. මෙය පරුමකවරුන්ගේ මෙරට ස්ථාපිත වීමේ හා ව්‍යාප්ත වීමේ පැරණි බව හා ශක්තිමත් බව නිසා ඇතිවූවක් බව පැහැදිළි ය. පූර්ව ඓතිහාසික අවධිය තුළ පරුමකවරුන්ගේ ප්‍රභවය සිදුවන්නට ඇති බව සුදර්ශන් සෙනවිරත්න විසින් පෙන්වා දී ඇත (Seneviratne 1989: 108). ප්‍රභවයේ පුරාතන බව නිසාම මොවුන් තත්කාලීන සමාජය තුළ ප්‍රබල ස්ථානයක් හිමිකරගෙන සිටි බව පෙනේ. එකල්හි ඔවුන් දේශපාලනික හා පරිපාලන ක්‍රියාවලිය සමඟ ද සම්බන්ධ වූ පිරිසක් විය (*එම*). සමකාලීන සමාජීය ක්‍රියාත්මකභාවය තුළ පරුමකවරු සමාජයේ සෑම අංශයක් කෙරෙහිම තම බලය පතුරුවාගෙන සිටි බව ඔවුන්ගේ වෘත්තිමය තත්ත්වයන් හා ක්‍රියාකාරීත්වයන් පිළිබඳ ව දැක්වෙන වගුව 4 ඇසුරින් තහවුරු වේ.

සමාජයේ සෑම ක්ෂේත්‍රයක් තුළම බලය පතුරුවාගෙන සිටි බැවින් මොවුන්ගේ ව්‍යාප්තිය භූමියේ විවිධ භූ විෂමතාවන් සහිත ප්‍රදේශයන් කරා ද යොමුවී තිබෙන බව පැහැදිළි ය. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ පිහිටි එකිනෙකට වෙනස් වූ භූ විෂමතා සහිත කලාපවලින් පරුමකවරුන් සම්බන්ධ ශිලාලේඛන හමුවීමෙන් ඉහත කාරණය තවදුරටත් තහවුරු වේ. ඒ අනුව මෙරට වාරි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රධාන භූමිකාවක් පරුමකවරුන් විසින් පවත්වාගන්නට ඇති බව උපකල්පනය කිරීමට පුළුවන.

වියළි කලාපීය ප්‍රදේශය තුළ ජනාවාස ඇති කරගෙන සිටි පරුමක නාමය මුල් කරගත් ජන කණ්ඩායම් මෙන්ම මුල් ඓතිහාසික අවධිය වන විට ගමික, බත, ගපති වැනි පදවි නාමයන් සහිත වූ ජන කණ්ඩායම් ද එම ප්‍රදේශයන් ජනාවාසකරණයට සැළකිය යුතු මට්ටමේ දායකත්වයක් ලබා දී තිබෙන බව පෙනේ. ඔවුන් විවිධ වෘත්තීන් හි නියැළී සිටි බව වගු සටහන් අංක 4 ඇසුරින් පැහැදිළි වේ.

වගුව 4. පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන අතර සඳහන් වන පරුමකවරුන් දැරූ විවිධ වෘත්තිමය තත්ත්වයන්

| පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනය හා අංකය (*Ic*. Vol I) | පරුමක නාමය | වෘත්තිය හෝ ක්‍රියාකාරීත්වය |
|---|---|---|
| මිහින්තලේ 3, 22 | බඩගරික පරුමක තිශ | භාණ්ඩාගාරික |
| මිහින්තලේ 22 | බඩගරික පරුමක මග | භාණ්ඩාගාරික |
| රාජගිරිකන්ද 59, 63, 64 | බඩගරික පරුමක ශෙන | භාණ්ඩාගාරික |
| මහඇළගමුව 230 | නාගරගුතිය පරුමක දක | නාගර පාලක |
| පෙරිය පුලියන්කුලම 355 | පරුමක අශ අදෙක වෙලු | අශ්වයින් පිළිබඳ අධ්‍යක්ෂ |
| මල්වත්ත 471 | අයක පරුමක උති | අයකැමි |
| බඹරගස්තලාව 507 | පරුමක බතකරක නග | රාජකීය මුළුතැන්ගේ ප්‍රධානී |
| සිතුල්පව්ව 606 | පරුමක අශරුය තිශ | අශ්වාරෝහක |
| සිතුල්පව්ව-කොරවක්ගල 620 | ශෙනපති පරුමක මිත | සේනාධිපති |
| එම 621 | බඩගරික පරුමක ශුමන | භාණ්ඩාගාරික |
| රිටිගල නාළල්පොත 251 | පරුමක උබහ ..... මහ ශෙනපති | මහා සේනාධිපති |
| කුරුණෑකල්ලු 319 | පරුමක කබර වෙලු ජිශ | ලෝහ සම්පත් (යකඩ) |
| සිතුල්පව්ව-දෙකුන්දරාවැව 650 | පරුමක වනගමිය චලුහ | ගම් ප්‍රධානී |
| ගෝනගල 665 | පරුමක ශෙනපති අබය | සේනාධිපති |
| තිස්සමහාරාම 703 | අයත පරුමක පුශ දෙව | අයකැමි |
| වැල එල්ලුගොඩකන්ද 724-8 | ශෙනපති පරුමක පුශ දෙව | සේනාධිපති |
| බලහරුකන්ද 761 | අයත පරුමක ශුමන | අයකැමි |
| දඹුල්ල 837 | මතුක ගම බොජික පරුමක තිශ | ගම් ප්‍රධානී |
| කණ්ඩලම 860 | තොට බොජික පරුමක උතර | තොටමුනේ ප්‍රධානී |
| කඹුරුලෙන 899-896 ab | ශිවක-අදක පරුමක මජ්ඣිම | සිවිකා අධ්‍යක්ෂ |
| පෙරියකඩු විහාරය 947 | පරුමක නැකතික තිශ | නැකත් කරු |
| සැස්සේරුව 1002 | පරුකමත පරුමක මතික විළිපි ශුමන | නාගරික කටයුතු කරවන්නා |
| තෝරව මයිලෑව 1035 | බඩගරික පරුමක ශුමන | භාණ්ඩාගාරික |
| තෝරව මයිලෑව 1037 | බමනගර බොජික පරුමක රොහන | නගර පාලක |
| අවුකන 1151 | වව්හමික පරුමක උවජනක | වැව් භාරකරු |
| අවුකන 1153 | වව්හමික පරුමක දසකහ | වැව් භාරකරු |
| හඳගල 1130 | වපි හමික පරුමක මහ වෙබලිය | වැව් භාරකරු |
| හඳගල 1132 | වපි හමික පරුමක මහදක | වැව් භාරකරු |

මෙම ප්‍රදේශයේ ජනාවාස වීම කෙරෙහි කෘෂි කර්මාන්තයට අමතර ව කලාපයේ ඇතැම් ස්ථානවලින් හඳුනාගත හැකි ඛණිජ වර්ග කෙරෙහි ආකර්ශණය වීමද හේතු වන්නට ඇත. අධ්‍යයන ක්ෂේත්‍රයට අයත්වන උතුරු මැද, වයඹ හා තදාශ්‍රිත ප්‍රදේශය ඇසුරින් ලෝහ කර්මාන්තය හා සම්බන්ධ විවිධ ශිල්පීය අංශයන්ගේ වර්ධනය සිදුවී තිබෙන බව සෙල්ලිපි ඇසුරින් අනාවරණය කරගත හැකි ය (*Ic*. Vol. i: No. 490, 925, 1049 ,1136). තඹකර නොහොත් තඹකරුවන් (*එම*. 319, 350-1, 750), කඹර හෙවත් යකඩකරුවන් (*එම*. 161), ගෙළගම හෙවත් ලෝකුරුගම (*එම*. 815), තොපෂ හෙවත් බෙලෙක්කරු (*එම*. 370) ආදී තොරතුරු මෙම ලේඛනවලින් හෙළි වේ. මීට අමතර ව මැණික්කරුවන් සම්බන්ධ තොරතුරු රැසක් ද සෙල්ලිපි ඇසුරින් අනාවරණය කරගත හැකි ය (*එම*. 74, 209, 791, 830). මේ හැරුණු විට වාණිජ කටයුතු

ද (එම. 356-7, 897) මෙම ප්‍රදේශය ජනාවාස වීමට හේතුවන්නට ඇත.

ක්‍රිස්තු පූර්ව 6 වන සියවසින් පසු මෙරට ඇතිවූ වැදගත්ම සිදුවීම වන්නේ මෙරට සම්පත් පැවති ප්‍රදේශ කරා සිදුවූ ඉන්දීය ජන සංක්‍රමණයි (මව. vii-ix). මේ නිසා මෙරට පූර්ව ඓතිහාසික ස්වදේශික ගෝත්‍රවල අනන්‍යතාවය සුරැකුණු බවත් සිතීමට නුපුළුවන. මේ නිසා සිදුවූ ජන මිශ්‍රවීම් හේතු කොටගෙන වඩාත් සංකීර්ණ සමාජයක් ලංකාවේ බිහිවූ අතර කෘෂික සමාජ, ශිල්ප සමාජ හා වාණිජ සමාජ වශයෙන් ශ්‍රේණි ගතවූ සමාජ ක්‍රමයක ලක්ෂණ පෙන්නුම් කිරීම ආරම්භ විය. මෙම වෙනස්වීම ස්ථාවර රාජ්‍යයක් කරා යොමුවීමට ප්‍රබල හේතුවක් වූ අතර ම එම තත්ත්වය මෙරට වාරි කර්මාන්තයේ ප්‍රගතිය කෙරෙහි ද සෘජුව ම බලපාන කාරණයක් විය.

වංසකතා මූලාශ්‍රවල දැක්වෙන තොරතුරුවලට අනුව ඉන්දීය ජන කොටස් ක්‍රිස්තු පූර්ව සවැනි සියවස පමණ වන විට දිවයිනේ වයඹ හා ගිණිකොන දිග ප්‍රදේශයන්හි ජනාවාස පිහිටුවීමට පටන්ගත් බවට සාධක ඇත (මව. vi-viii). ඉන්දීය ජන කොටස් ප්‍රථමයෙන් සංක්‍රමණය වූවේ යැයි උපකල්පනය කෙරෙන වයඹ දිග මුහුදු තීරය දිවයින වටා වූ නොගැඹුරු ම මුහුදු තීරය වේ. බටහිර ඉන්දියාවෙන් පැමිණි පිරිස් වයඹ දිග වෙරළ තීරයට ද, නැගෙනහිර ඉන්දියාවෙන් පැමිණි පිරිස් ගිණිකොන දිග වෙරළ තීරයට ද ගොඩබැස තදාශ්‍රිත ප්‍රදේශවල මූලික ජනාවාස බිහිකරගන්නට ඇති බව පෙනේ. මෙය ඉන්දියන් සාගරයේ සුළඟ හැමීමේ දිශාවේ වෙනස්වීම් මත සිදුවන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ අනුව පැහැදිළි වන්නේ ප්‍රථම ඉන්දීය ජන සංක්‍රමණිකයින්ගේ ජනාවාස වයඹ දිග හා ගිණිකොන දිග ශුෂ්ක කලාපයන්හී බිහිවන්නට ඇති බවයි. මෙම කලාපය කෘෂිකර්මය සඳහා වඩාත් යෝග්‍ය ප්‍රාදේශයක් නොවීය. එයට ප්‍රධාන හේතුව වූයේ පාරිසරික උෂ්ණත්වය සමඟ මෙම ප්‍රදේශයේ පසෙහි තෙතමනය රඳා නොපැවතීමයි. ලැටසෝල් (Latsol) පස සහිත මෙම ප්‍රදේශයන්ට ලැබෙන වැසි ජලය පොළවට උරා ගැනීමේ සම්භාවිතාව ද ඉහළ මට්ටමක පවතින බැවින් වාරි කර්මාන්තයන් ගොඩනැගීම සඳහා ද භූමිය යෝග්‍ය නොවීය. මේ හේතුව මත වැව් හා වෙනත් වාරි කර්මාන්තයන් ඇරඹීමට සුදුසු සහ වගාවන් සඳහා යෝග්‍ය පස ව්‍යාප්ත වූ භූමි ප්‍රදේශයන් සහිත රට අභ්‍යන්තර තැනිතලා ප්‍රදේශ කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමුවන්නට ඇති බව සිතිය හැකි වේ. භූමියෙන් ලද අත්දැකීම් සමග ක්‍රමයෙන් රට තුළට ගමන් කළ ඉන්දීය ජන සංක්‍රමණිකයින් වෙරළට ආසන්න සරුසාර කලාපයේ සහ වියළි කලාපීය තැනිතලා ප්‍රදේශවල ස්වකීය ජනාවාස පිහිටුවා ගැනීමට ක්‍රියාකර තිබේ. කොළොම් ඔය ඉවුරෙහි අනුරාධ ග්‍රාමය පිහිටුවීම, ගම්භීර නදී තීරයේ උපතිස්ස ග්‍රාමය ගොඩනැගීම මෙන්ම කලා ඔය නිම්නයේ උරුවේල ග්‍රාමය ඇතිකරලීම මෙයට නිදසුන් වේ (මව. vii: 43-6). පණ්ඩුකාභය රජු අනුරාධ ග්‍රාමය තවදුරටත් සංවිධානාත්මක නගරයක් බවට පත්කරන ලද්දේ ද (එම. ix: 9-11) වියළි කලාපීය ගංගා නිම්නබඳ ප්‍රදේශවල පවතින වැදගත්කම අවබෝධ කරගෙන බව පැහැදිළි ය. ඉන්දීය ජන සංක්‍රමණිකයින් හා මෙරට ස්වදේශික ජන කණ්ඩායම් අතර ඇතිවූ සම්බන්ධතාවය හා සම්මිශ්‍රණය වේගවත් ලෙසින් රට අභ්‍යන්තරයට ජනාවාස ව්‍යාප්තවීමට හේතු වන්නට ඇත.

ශ්‍රී ලංකාවේ වාසය කළ ස්වදේශික ජනතාව සහ උතුරු ඉන්දියාවේ සිට දකුණු ඉන්දියාව හා සාගර කළාපය ඔස්සේ මෙරටට සංක්‍රමණය වූ ජන කණ්ඩායම් වී ගොවිතැන ප්‍රධාන කොටගත් කෘෂි අර්ථ ක්‍රමයක් කෙරෙහි නැඹුරුවූ පිරිසක් විය. ඒ අනුව ඔවුන් මෙරට වියළි තැනිතලා ප්‍රදේශවල පිහිටීම මත පදනම් ව සුළු වාරි කර්මාන්ත සඳහා යොමුවූ බව පැහැදිළි ය. ඉන්දීය ජන සංක්‍රමණිකයින්ට ඒ සඳහා ඉන්දියාව තුළදී ලද අත්දැකීම් ද ප්‍රයෝජනවත් වන්නට ඇත. මුල් කාලීන වියළි කලාපීය ජනාවාස බිහිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන වාරි සාධක දෙකක් බ්‍රෝහියර් පෙන්වා දී ඇත.

1.) ඉතා සරල ලෙස නිර්මාණය කරන ලද තඩාගයක වැසි ජලය රඳවාගෙන එම ජලය ප්‍රාථමික ඇළ මාර්ග ඔස්සේ අවශ්‍යතාවයන් සඳහා ප්‍රයෝජනයට ගැනීම.

2.) වසර පුරා ජලය රැගෙන යන ජල මාර්ග ප්‍රාථමික අයුරින් ගල් පර්වත දැව ආදිය දමා හරස්කොට එම ජලය කුඩා ඇළ මාර්ග ඔස්සේ අවශ්‍යතාවයන් සඳහා ලබාගැනීම (බ්‍රෝහියර් 2007: 18; නිකලස් 2001: 214).

ස්වදේශික ජනතාව හා ඉන්දීය ජන සංක්‍රමණිකයින් තම ජනාවාස නිර්මාණය

කරගෙන ඇත්තේ සාමූහික රටාවක් තුළ බව පැහැදිලි ය. ප්‍රධාන වශයෙන් දැව කණු හා වරිච්චි භාවිතයෙන් ඉදිකරන ලද මෙම නිවාස වෘත්තාකාර රටාවකින් යුක්ත විය. මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුරාධපුරයේ ඇතුළු නුවර සල්ගහවත්ත සිදුකරන ලද (ASW2) කැණීම් මගින් හෙළිවී තිබේ (Coningham 1999: 126). මෙම සම්ප්‍රදායේ නිවාස වර්තමානයේ දකුණු ඉන්දීය ගෝත්‍රික ජනතාව විසින් භාවිත කරනු ලැබීම එම සම්ප්‍රදාය නොනැසී පැවති බවට සාක්ෂියකි. මෙවැනි නිවාස සමූහයක් ආවරණය වන පරිදි වඩා උස් නොවූ බැම්මකින් යුතු අක්කර කිහිපයකට පමණක් සීමාවූ කුඩා ප්‍රමාණයේ වැවක් ඔවුන් විසින් ශ්‍රම දායකත්වයෙන් යුතු ව ඉදිකර ඊට පහළින් තම ගොවිබිම් පිහිටුවා ගන්නට ඇත. ඒ අනුව මුල් කාලීන වියළි කලාපීය "ගම" වැව කේන්ද්‍ර කරගෙන ගොඩනැගෙන්නට ඇති බව උපකල්පනය කිරීමට පුළුවන. මේ හේතුව මත මෙම කුඩා වැව් ග්‍රාමීය වැව් ලෙස අර්ථ දැක්වීමේ හැකියාව පවතී.

මුල් කාලීන ජනාවාසකරණයෙහි ලා මෙවැනි ග්‍රාමීය වැව්වල දායකත්වය ඉතා ඉහළ මට්ටමක පැවති බව හඳුනාගැනීමට පුළුවන. එවැනි ග්‍රාමීය වැව් ආශ්‍රිතව ජනාවාස බිහිවූ බවට පැහැදිලි සාක්ෂි පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් ද අනාවරණය කරගත හැකි ය. නැට්ටුක්කන්ද ලිපියේ සඳහන් "එරකපි" නම් ගම බිහිවීමට එරිකවාපි නම් වැවක් මුල්වී තිබීම (*Ic*. Vol.i: No. 168), මිහින්තලේ ලිපියක දැක්වෙන "ලොණ වාපි" යන්න එකතුවී "ලොණපි" යනුවෙන් සඳහන් ස්ථාන නාමය සකස්වීම (*එම*. No. 25), හඳගල ලිපිය "අනුලපිවපි" යනුවෙන් සඳහන්වීම (*එම*. No. 1130), මිහින්තලේ රාජගිරි කන්ද ලිපියක " උපලවි" (උපලිවව්) යනුවෙන් ග්‍රාම නාමයන් සඳහන් වීම (*එම*. No. 112; *Ez*. Vol. v: 225) මෙයට නිදසුන් ලෙස දැක්විය හැකි ය. පුරාතනයේ සිටම ග්‍රාමීය වැව් ජන ජීවිතයට වඩාත් සමීප සාධකයක් වූ ක්‍රිස්තු පූර්ව සමයේ සිටම ස්ථාන නාම සකස්වීම කෙරෙහි එය බලපා තිබීමෙන් තහවුරු වේ (විතානාච්චි 1999: 96).

දිවයිනේ වියළි කලාපය පුරා ව්‍යාප්තව තිබෙන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන අනුව එම ප්‍රදේශවල ජනාවාස පැතිරීම පිළිබඳ අදහසක් ඇතිකරගත හැකි වුවද එම ජනාවාස පවතින්නට ඇත්තේ තුනී ජන විසිරීමක් සහිත ව බව සිතිය හැකි වේ. මේ හේතුවෙන් ග්‍රාමීය වැව් උපයෝගී කරගෙන සිදුකරන ලද කෘෂි කර්මාන්තය ඔවුන්ට ප්‍රමාණවත් වන්නට ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා උතුරු පළාතේ පමණක් මෙවන් කුඩා ග්‍රාමීය වැව් 11200 ක් තිබූ බව 1904 දී කරන ලද සමීක්ෂණයකින් හෙළි වී තිබේ (අප්‍රකාශිත වාර්තා - වාරි මාර්ග දෙපාර්තමේන්තුව). මීට අමතර ව එක් භූමි ප්‍රදේශයක් තුළ වැඩි සනත්වයකින් යුතු කුඩා වැව් පිහිටීම සම්බන්ධයෙන් සාක්ෂි හමුවන්නේ වයඹ පළාතේ දැදුරු ඔය නිම්නයේ වාරියපොල ප්‍රදේශයේ හා රුහුණු ප්‍රදේශයේ තිඹොල්කැටිය ප්‍රදේශයෙනි (බලන්න 1.63360 වාරියපොල හා තිඹොල්කැටිය සිතියම්. මිනින්දෝරු දෙපාර්තමේන්තුව).

ක්‍රිස්තු පූර්ව සමයේ ඉදිකරන ලද වැව් ගණනාවක් පිළිබඳ තොරතුරු වංසකතාවේ සඳහන් ව ඇත. අනුරාධ නම් ඇමතිවරයා අනුරාධගම ගොඩනගන අවස්ථාවේ දී වැවක් තැනූ බව මේ සම්බන්ධයෙන් දැක්වෙන පැරණිම තොරතුර වේ (*මව*. ix: 11). පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය පිහිටුවීමේ දී ජයවාපි, අභයවාපි හා ගාමිණිවාපි නමින් වැව් තුනක් ඉදිකර ඇත (*මව*. ix: 83 සිට). ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී මහානාග උප රජු කරච්චවාපි නමින් වැවක් කරවා තිබේ (*මව*. xxii: 4). දුටුගැමුණු රජුගේ යෝධයකු වූ ලභිය වසභ විසින් වැවක් කරවා ඇත (*එම*. xxiii: 92 - 5). සද්ධාතිස්ස කුමාරයා විසින් මෙහෙයවන ලද දීඝවාපි ප්‍රදේශයේ කෘෂි කර්මාන්ත සංවර්ධනයේදී (*එම*. xxiv: 2-3) මෙවැනි වැව් රාශියක් තනවන්නට ඇති බව සිතීමට පුළුවන. හුන්දරවාපි (සුන්දර වැව) හා වෙහෙරවාපි (විහාර වැව) නමින් වැව් පදනම් ව ගොඩනැගුණු ගම්මාන පිළිබඳ ව ද සඳහන් වීමෙන් මේ බව තවදුරටත් තහවුරු වේ (*මව*. xxiii: 45,90). මීට අමතර ව වංසකතා ආශ්‍රයෙන් මේ කාලය තුළ ගොඩනැගුණු තවත් වැව් රාශියක් පිළිබඳ ව කරුණු අනාවරණය කරගත හැකි ය.

ාමීය වැව් ඉදිකිරීම පොදු කටයුත්තක් සේ සලකා සිදු කෙරුණ ද ඇතැම් වැව් ඉදිකිරීම ගමේ ප්‍රධානත්වය දැරූ පරුමකවරුන් විසින් සිදුකර තිබෙන අයුරු දක්නට ලැබේ. ඔවුන් "වපි හමික" ලෙසින් හඳුන්වා ඇත. අනුලපි වපි හමික පරුමක මහවෙබලි, පරුමක නකොඩපික වපි හමික, කඩපි වපි හමික පරුමක උවහජනක ආදී සඳහන් මෙයට

නිදසුන් ය (*Ic*. Vol. i: Nos. 1130, 1132, 1151). මීට අමතර වෙනත් අයුරින් වැව් හා සම්බන්ධ පරුමකවරු පිළිබඳවද තොරතුරු සඳහන් වේ (*එම* 1051-2, 1200, 1225). තවද පරුමකවරුන් නොවන වැව් හිමිකරුවන් පිළිබඳ ව ද තොරතුරු ලිපි මගින් අනාවරණය වේ (*Ic*. Vol. i: Nos. 1122, 1129 ). ඒ අනුව පැහැදිළි වන්නේ වැව් ඉදිකිරීම පොදු කටයුත්තක් ලෙස මෙන්ම පෞද්ගලිකව ද සිදුවී තිබෙන බවයි. වැවේ හිමිකාරීත්වය යනු එහි අයිතියට වඩා වැවේ පරිපාලනය සමග සම්බන්ධ වුවක් බව පෙනේ.

පණ්ඩුකාභය රාජ්‍ය කාලය වනවිට ඉන්දීය ජන සංක්‍රමණිකයින් හා මෙරට ස්වදේශිකයින් අතර සම්මිශ්‍රණයක් ඇතිවී ඔවුන් තම කටයුතු සියල්ල සාමුහිකව සිදුකළ බවට සිතිය හැකි තරම් තොරතුරු වංසකතාවෙන් අනාවරණය වේ (*මව*. ix: 22-26). දෙවනපැතිස් (ක්‍රි.පූ. 250 - 210) රාජ්‍ය සමයේ දී සංවිධානාත්මක ලෙස මෙරටට ප්‍රධානය කෙරෙන බුදු දහම (*මව*. xiv: 1 සිට) සියලු ජන කොට්ඨාසවල එකමුතු බව වැඩි වර්ධනය කරලීමට ප්‍රධාන හේතුවක් විය. මෙම කාලයෙන් පසු දිවයිනේ වියළි තැනිතලා ප්‍රදේශය ප්‍රධාන කොටගත් බොහෝ ස්ථානවල දක්නට ලැබෙන පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි මගින් මෙම එකමුතු බව හා ජන මිශ්‍රණය මැනවින් තහවුරු වේ (*Ic*. Vol. i). මෙවැනි ශිලා ලේඛන ආශ්‍රිත ව වැඩි වශයෙන් දක්නට ලැබෙන **"පරුමක, ගමණි"** වැනි අභිධාන පාඨවලින් පොදු ජන ප්‍රභවයක් පිළිබඳ අදහසක් ඇති කරගත හැකි ය (ධීරානන්ද 2004: 85-110). දෙවනපැතිස් රාජ්‍ය කාලයේ ඇති වූ සමාජීය වර්ධනය අනුරාධපුරය කේන්ද්‍ර කරගෙන බිහිවු රජරට ශිෂ්ටාචාරය වඩාත් සංවිධානාත්මක බවට පත්වීමට හේතුවිය (බස්නායක 1997: 9). ඒ සඳහා රාජ්‍යත්වය ස්ථාවර බවට පත්වීම මූලික වශයෙන් බලපා තිබෙන බව පැහැදිළි ය. ස්ථාවර ජන සමාජයක් පැවති බවට තහවුරු කෙරෙන ප්‍රධාන සාක්ෂිය වන්නේ පූර්ය හා අපර බ්‍රාහ්මී ශිලා ලේඛන මගින් හඳුනාගත හැකි විවිධ නිලතල හා වෘත්තීන් පිළිබඳ තොරතුරු ය (බලන්න වගු අංක 5).

අනුරාධපුර යුගයේ මුල් අවධිය වනවිට ශ්‍රී ලාංකීය සමාජය පංති ස්ථරායනයන් මත සකස් වූ සමාජ ක්‍රමයක් තුළ ගොඩනැගී තිබුණු බව හඳුනාගැනීමට පුළුවන ( Ellawala 1969: 37-55). එම පංති විවිධත්වය තවදුරටත් සකස්වීම කෙරෙහි ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව සමග මෙරටට පැමිණි අටලොස් කුළයක් වූ ජන කණ්ඩායම් ද ඉවහල් වන්නට ඇත ( *මවංටී* xix: 1-4, 10-11, 30). මහාවංසටීකාවේ මෙම ජන පිරිස් හඳුන්වා ඇත්තේ 'කුලානි' යන පදයෙන් වන අතර (*එම*) එමගින් කුලය යන්න අර්ථ ගැන්වෙන බව පැහැදිළි ය ( *මව* xix: 1-4). ඒ අනුව අනුරාධපුර යුගයේ මුල් අවධිය වනවිටම පංති ස්ථරගතවීම තුළට කුල ක්‍රමය ද එක් වූ බව සිතිය හැකි වේ. එය විවිධ වෘත්තීන් මත ගොඩනැගුණ ක්‍රියාවලියක් බව පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවල දැක්වෙන ඇතැම් සඳහන් වලින් තහවුරු වේ ( *Ic*. Vol. i).

සමාජ ස්ථරායනය මධ්‍යකාලීන ලාංකීය සමාජය වනවිට තවදුරටත් සංකීර්ණ වූ ස්වභාවයක් දක්නට ලැබේ ( ගයිගර් 1969: 32-53). වෘත්තිය මත පදනම් ව බෙදීගිය කුළ දූරාවලියක් මහනුවර යුගය වනවිට සකස්වීම උදෙසා ( පීරිස් 1964: 183 - 200; කුමාරස්වාමි 1962: 20-1) අනුරාධපුර යුගයේ සිට ක්‍රියාත්මක වූ පංති ස්ථරගතවීම යම්තාක් ප්‍රමාණයකට හේතු වන්නට ඇත.

පංතිය හෝ කුළය මත සකස් වූ සමාජ ස්ථරායනය ක්‍රියාත්මක වූයේ සිරස් ක්‍රමවේදය (Horizontal System) අනුව ය. එය බලය මත පදනම් වූ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස හඳුනාගැනීමට හැකියාව පවතී. සමාජ ස්ථරායනය සකස්වීමේ දී ඉහළ යැයි සම්මත වෘත්තීන් හි නියැලුණ ජනතාව සමාජයේ උසස් කුළ නියෝජනය කළ පිරිස් විය. මොවුන් බොහෝ විට රාජ්‍යයත්වය සමග මෙන්ම රාජකීයයන් නියෝජනය කරන කුළ සමග ඉතා සමීපව කටයුතු කර තිබේ. මුල් ඓතිහාසික අවධිය වනවිට තිබුණු ඉහළ සමාජ ස්ථර ලෙස හඳුනාගත හැකි පරුමකවරු, ගමිකවරු හා ගමණිවරු අතර සිදුවූ විවාහ සම්බන්ධතාවන් පිළිබඳ ව පවා තොරතුරු හමුවීම මගින් මේ බව තහවුරු වේ. මෙම සමාජ සකස්වීමේ ක්‍රියාවලිය තුළ රජු විධානය කරන්නා වන අතර නියෝගය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් වී ඇත්තේ රජු සමග සමීපව ඇසුරු කළ උසස් යැයි සම්මත කුළවලට අයත් ජන පිරිස් බව පෙනේ. ඒ අනුව විධායකය සමග සම්බන්ධවෙමින් පරිපාලකයන් ලෙස කටයුතු කිරීම ප්‍රභූ කුළවලට අයත් පිරිස් විසින් සිදුකරන්නට ඇත.

වර්තමාන දෘෂ්ටිකෝණය තුළ කුළ ක්‍රමය විවේචනයට ලක්වුව ද පුරාතන සමාජ

**වගුව 5 Inscription of Ceylon Vol. i මගින් හඳුනාගත හැකි ක්‍රිස්තු පූර්ව අවසාන භාගයේ සිට ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසෙන් පසු භාගය දක්වා ගොඩනැගෙන සංවිධානාත්මක සමාජය තුළ නිළතල සහ වෘත්තීයයන්**

| සෙල්ලිපියේ සඳහන් කාර්යය | කාර්යභාරය | Inscription of Ceylon Vol I හි වාර්තාගත යොමු අංකය |
|---|---|---|
| වපිහමික | වැව් භාරකරු | 1122,1130,1132,1153,1156,1200,1217-8, 1250 |
| වියගහ | සීසෑම් කටයුතු භාරකරු | 142 |
| නගුලි | නගුල මෙහෙයවන්නා | 421,869,911,972,97 |
| මහරකඩ | මහරජු | 29,422,425,703,894,1027 |
| රකඩ | රජු | 338,404,550,792,1120,1207 |
| සේනාපති/සෙනපති | සේනාධිපති | 251,1161 |
| අමත/අමතය/ | ඇමති | 161,167.1,797,1064,1179,1231 |
| චුඩ | මැණික්කරු | 44,71,98,125,266,299,372,400,402,582,586,666,670,680,707,968,998,1208,122 |
| තබර/තඹකර | තඹකරු | 319,350,351 |
| කබර | යකඩකරු | 161,301,381,720,1198 |
| කොපෂ | බෙලෙක්කරුවා | 370 |
| තලදර/තුලදර | රන්කරුවා | 80,593 |
| කොඩික | කොටුපළ කාර්ය කරන්නා | 309 |
| භූමික බොජික | භූමි පාලක | 171,1149,1057,1150,1215,1226 |
| නගර ගුතික | නගර පාලක | 230 |
| නගර බොජක | නගරයේ අයබදු එකතු කරන්නා | 1037 |
| කොට බොජික | කොටුපළ භාරකරු | 860 |
| ගණකන | ගණකාධිකාරී | 212,419,580,619,673,679,729,1070 |
| බඩගරික/බඩකරික | භාණ්ඩාගාරික | 3,39,269,621,1035,1110,1192 |
| දූතක | දූතසේවා | 295 |
| පූකියන | වෙළඳ කටයුතු | 320,1198 |

ක්‍රියාත්මක භාවය උදෙසා කුළ ක්‍රමය ඉතා පුළුල් දායකත්වයක් දක්වා තිබෙන බව හඳුනාගැනීමට පුළුවන. එයට හේතුව වන්නේ සමාජයේ පැවැති සියලුම වෘත්තීන් එක් එක් කුළයන් අනුව බෙදීගොස් තිබීම නිසාය. මහනුවර අවධියේ ඉතාමත් තදින් පැවැති මෙම තත්ත්වය ඊට පෙර ද විවිධ මට්ටම්වලින් ක්‍රියාත්මක වන්නට ඇත. යම්හෙයකින් කිසියම් කුළයක් විසින් සිදුකළ යුතු වෘත්තීයක් ඉටුනොවීම තුළ ඉහළ සිට පහළට සකස් වී තිබුණු සිරස් සමාජ සංවිධානයේ පැවැත්මට යම් යම් බාධා ඇතිවන්නට ඇත.

සංවිධානාත්මක සමාජ ක්‍රමය තුළ ගොඩනැගුණු සමාජ ස්ථරායනය සකස්වීමේ ක්‍රියාවලිය ඉතාමත් පැහැදිළි ලෙසට මෙරට වාරි කර්මාන්තය ගොඩනැගීම කෙරෙහි ආරම්භක අවධියේ සිටම බලපාන්නට ඇති

බව සිතිය හැකි වේ. ඒ අනුව රජුගේ විධානය මත ක්‍රියාත්මක වූ ඉහළ මධ්‍ය ස්ථරය නියෝජනය කරන පිරිස් පහළ ස්ථරවලට අයත් සියළු ජනතාවගේ සහයෝගය ගනිමින් එකී වාරි කර්මාන්තයේ නියැලෙන්නට ඇති බව සිතිය හැකි ය. වැව හෝ අමුණ ගොඩනැගීමට මෙම සියලු ජනකණ්ඩායම් ශ්‍රමයෙන් සහභාගී වූ බවක් ඉන් අදහස් නොකෙරේ. බොහෝ වෘත්තීන්ට අයත් පිරිස් අනියම් වශයෙන් වාරි කර්මාන්තවලට සම්බන්ධවන්නට ඇතැයි සිතිය හැකි වේ. ජනතාවගේ මෙම සේවය රජු හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ පරිපාලන නිලධාරීන් විසින් ලබාගෙන ඇත්තේ ප්‍රාග්ධනයක් මත පදනම් කරගෙන නොවන අතර එය හුදෙක්ම රාජකාරී සේවය මත සකස් වූ ක්‍රියාවලියක් ලෙසින් අර්ථ ගැන්විය හැකි ය.

## සමාලෝචනය

මෙතෙක් සිදුකළ පර්යේෂණ මගින් අනාවරණය කරගත හැකි වූ තොරතුරු අනුව පැහැදිළි වන්නේ වාරි කර්මාන්තයේ ආරම්භය මෙරට පූර්ව ඓතිහාසික අවධිය තෙක් දිවයන්නට ඇති බවයි. මෙරට වියළි කලාපය ආශ්‍රිත ව ස්ථාවර ජනාවාස ගොඩනගාගත් බවට සාක්ෂි හඳුනාගත හැකි ස්වදේශික ප්‍රාථමික ග්‍රාමීය ජනතාව කෘෂිකාර්මික කටයුතු කරගෙන යෑම පිණිස අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග අතර ස්වභාවික ජල මාර්ග ආශ්‍රිත ව අර්ධ ස්ථාවර ද්‍රව්‍ය භාවිතයෙන් සකසන ලද විශාල නොවූ තාවකාලික අමුණු (අමුණු වැටි) භාවිතය හඳුනාගත හැකි ය. මෙමගින් අවට සීමිත වපසරියකට ජලය ලබාගත් බව පැහැදිළි ය. මෙම ක්‍රියාවලිය මෙරට වාරි කර්මාන්තයේ ප්‍රභවයේ ප්‍රාරම්භක අවස්ථාව ලෙස සැළකිය හැකි වේ. පූර්ව ඓතිහාසික ජනාවාස පිළිබඳ සාක්ෂි හමුවන යාන් ඔය, මල්වතු ඔය, කලා ඔය, දැදුරු ඔය, කිරිඳි ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය හා අඹන් ගඟ ආශ්‍රිත භූමි ප්‍රදේශයන් හි හඳුනාගත හැකි මූල ඓතිහාසික ජනාවාස පිළිබඳ සුසාන භූමි සාක්ෂි අනුව නිගමනය කළ හැකි වන්නේ එම ජල මාර්ග හා ඒවාට සම්බන්ධවන අතු ගංගා ආශ්‍රිත ව සිදුකරනු ලැබූ කෘෂි කර්මාන්තය සඳහා භාවිත කරනු ලැබූ ප්‍රාථමික වාරි කර්මාන්තය තුළ වාරි කර්මාන්තයේ ප්‍රභවය ද සිදුවන්නට ඇති බවයි. ඒ සඳහා ඒ වනවිට ඔවුන් අත්පත් කරගෙන සිටි යකඩ තාක්ෂණය පිළිබඳ දැනුම ද මේ සඳහා උපයෝගී කරගන්නට ඇති බව සිතිය හැකි ය. ප්‍රාථමික වාරි කර්මාන්තය භාවිතයේ පැවැති සාර්ථකත්වය ජනතාව ගංගා නිම්නාශ්‍රිත ව තවදුරටත් ස්ථාවරව රැඳී සිටීමටත්, ව්‍යාප්ත වීමටත් හේතු වන්නට ඇත. විශේෂයෙන් ම ප්‍රාථමික ජනාවාස කිහිපයක් ඒකාබද්ධව නිර්මාණය වන මහාගාම සංකල්පය, පොකුරු ජනපද ආශ්‍රයෙන් කළඑළි බැසීම මෙම නිම්නාශ්‍රිත ව සිදුවී තිබේ. යාන් ඔය නිම්නය ගත් කළ අපට හඳුනාගත හැක්කේ මුළු සාර්ව නිම්නය පුරාම පොකුරු ජනපද පිහිටා තිබූණු ආකාරයකි. මෙම නිම්නය තුළ ස්ථාපිතව තිබෙන පූර්ව ඓතිහාසික සුසාන භූමිවල වපසරිය හා ඒවායෙහි මිහිදන් කර ඇති මළවුන්ගේ ප්‍රමාණය පිළිබඳ සැළකිල්ලට ගැනීමේ දී විශාල ජනතාවක් යාන් ඔය නිම්නයේ ජීවත් වූ බව පැහැදිළි ය. විශේෂයෙන් ම එවැනි ජනතාවකට භූ පතන සහිත භූ රූපණය පදනම් කොට නිර්මාණය කරන කුඩා වාපි මගින් සපයන ජලය පරිභෝජනයට මෙන් ම කෘෂි කර්මාන්තය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් අතිරේක ජල සම්පාදනය පිණිස වාරි කර්මාන්තයේ මූලික සංකල්පය (Primary concept) පූර්ව ඓතිහාසික මුල් යකඩ යුගයේ කළඑළි බසින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. මෙම තත්ත්වය අඩු වැඩි වශයෙන් වියළි කලාපයේ අනෙකුත් ප්‍රදේශවල ද ක්‍රියාත්මක ව පැවති බවට සාක්ෂි පවතී.

පුරාතන රාජකීයත්වය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී පැහැදිළි වන කාරණයක් වන්නේ ඔවුන් බොහෝ විට ක්‍රියාත්මක වී ඇත්තේ ප්‍රායෝගිකත්වය මත සිට වන බවයි. ජන අවශ්‍යතාව හඳුනාගැනීම තුළ ඔවුනගේ අවශ්‍යතාව සපුරාලීමට පියවර ගෙන ඇත. පුරාතන ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය ද, වැඩවසම් සමාජ ක්‍රමය තුළ ගොඩනැගුණු ඉහළම ස්ථරයේ නායකත්වය වන රජු විසින් අවශ්‍යතාවය පදනම් කරගනිමින් දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකි ය. ජනාවාස ස්ථාපිතවීම, ජන ප්‍රසාරණයේ ස්වභාවය හා වේගය මත වාරි කර්මාන්ත ඉදිවීම සිදුවන්නට ඇත. ඒ අනුව පුරාතන වාරි කර්මාන්තය අවශ්‍යතාව හඳුනාගනිමින් කාලානුරූපීව කරන ලද ජනානුකූල නිර්මාණයක් වන බව පැහැදිළි ය.

## ස්තූතිය

නව අදහස් සහ කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ආචාර්ය තුසිත මෙන්දිස් සහ තිලංක මනෝජ් සිරිවර්ධන යන මහත්වරුන්ට.

**ආශ්‍රිත ග්‍රන්ථ**

**ප්‍රාථමික මූලාශ්‍ර**

*මහාවංසය* (සිංහල) 1967 - සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව.

*Epigraphia Zeylanica vol V.* 1955 - London, Oxford University Press.

***Inscription of Ceylon Vol. I. Part. I,II*** 1970 - Colombo, Department of Archaeology.

***Inscription of Ceylon Vol. II*** 1983 - Colombo, Department of Archaeology.

**ද්විතීයික මූලාශ්‍ර**

කුමාරස්වාමි, ඒ. කේ. 1962 - ***මධ්‍ය කාලීන සිංහල කලා***, පරි. සෝමරත්න, එච්. ඇම්., කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

ගයිගර්, ඩබ්ලිව්. 1969 - ***මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය***, පරි. ආරියපාල, ඇම්. බී, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

තෙන්නකෝන්, එම්. යූ. ඒ. 1993 - ***නියඟය සහ ගොවියා***, කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුව.

ධීරානන්ද, එච්. හිමි 2004 - ***රාජත්වය, රාජ්‍යය සහ ආගම***, වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ.

නිකලස්, සී. ඩබලිව්. 1964(2001) - ජල සම්පාදනය, ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය***, කාණ්ඩය i, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය: 213-217.

පීරිස්. ආර් 1964(2001) - ***සිංහල සමාජ සංවිධානය; මහනුවර යුගය***, බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ.

බස්නායක, එච්. ටී. 1997 - ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මෙන්ඩිස්, ඩී. ටී. 2010 – පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය පිළිබඳ ව සිදු කෙරෙන පුරාවිද්‍යා අධ්‍යයනයක්, අප්‍රකාශිත දර්ශන විශාරද උපාධි නිබන්ධනය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

විතානාච්චි, සී. ආර්. 1999 - පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන ඇසුරින් අනාවරණය වන පුරාණ ලංකාවේ ස්ථාන හා ග්‍රාම නාම, ***Studies in Humanities, Journal of the Dept. of Humanities***. Rajarata University of Sri Lanka, Vol. i, No.i: 89-106.

Bandaranayaka, Senaka, Mogren, Mats, 1990, ***Settlement archaeology in Sigiri Dambulu region,*** Post Graduate Institute of Archaeology, Colombo.

Begly, V. 1981 - Excavation of Iron Age burials at Pomparippu, 1970. ***Ancient Ceylon. Journal of the Archaeological Survey Department in Sri Lanka,*** Vol.4, 49-141.

Brohier, R.L 1934 -1979 - ***Ancient Irrigation Works in Ceylon***. Part i-iii. Colombo, Ministry of Mahaweli Development.

Claessen, H. J. M., and Skalník, P. 1978 - The Early State: A Structural Approach, ***The The study of the state***, ed. Henri, J.M. Claessen and peter Skalnik, The Hague, Mouton publishers: 533–596.

Coningham,R.A.E. 1999 - ***Anuradhapura.The British-Sri Lanka excavations at Anuradhapura Salgaha Watta 2***, Vol. i, Oxford, Hadrian books Ltd.

Deraniyagala,S.U. 1992b - ***The Prehistory of Sri Lanka***; An Ecological Perspective, Part II, Colombo, Archaeological Survey Department.

Ellawala, H. 1969 - ***Social history of early Ceylon***, Colombo, Department of Cultural Affairs.